සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 11 - ශ්‍රේණිය

## ඉතිහාසය - I

නම/විභාග අංකය :- ................................................................ කාලය: පැය 01යි.

සැලකිය යුතුයි.

- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්නවලට (1) , (2) , (3) , (4) පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන උත්තර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරා ගත් පිළිතුරේ අංකයට සැසඳෙන කවය තුළ(×) ලකුණ යොදන්න.
- උත්තර පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද පරිස්සමෙන් කියවන්න.

(01) ශ්‍රී ලංකාවේ ඉතිහාසය හැදෑරීමට ඇති පැරණිතම මූලාශ්‍රය,
i ථූප වංශය ii දාඨා වංශය iii දීප වංශය iv මහා වංශය

(02) අතීතයේ දී භාවිතා කළ බ්‍රාහ්මී අක්ෂර දක්නට ඇත්තේ,
i රන්පත්වල ii තඹපත්වල iii පුස්තකවල iv සෙල්ලිපිවල

(03) 'ඩිමුන්ඩෝ' නමැති විදේශ සාහිත්‍ය කෘතිය රචනා කරනු ලැබුවේ,
i කොස්මස් ii ඇරිස්ටෝටල් iii මෙගස්තිනස් iv ටොලමි

(04) පළමුවන විජයබාහු රජතුමා පිළිබඳව සඳහන් වන පුරා විද්‍යාත්මක මූලාශ්‍රය වන්නේ,
i පනාකඩුව තඹ සන්නස ii වල්ලිපුරම් රන්පත
ii මිහින්තලා පුවරු ලිපිය iv අභයගිරි සෙල්ලිපිය

(05) භාතිකාභය රජු දවස රුවන්වැලිසෑය අලංකාර කිරීමට වීදුරු පබළු ගෙන්වීමට දූතයන් යවනු ලැබූ රාජ්‍යය වන්නේ,
i අරාබිය ii රෝමය iii ග්‍රීසිය iv චීනය

(06) වැටකින් ආවරණය කරනු ලැබූ පැරණි ගමක් හඳුන්වනු ලැබුවේ,
i නියම්ගම් ii පරිකිත්ත ගම් iii අපරිකිත්ත ගම් iv ඔලගම් ලෙසය

(07) ක්‍රි.ව.9 වන සියවසේ ලියවුණු සෙල්ලිපිවල එක්තැන්සමිය යන යෙදුම යොදා තිබෙන්නේ කුමන ආයතනයක් හැඳින්වීම සඳහා ද?
i ව්‍යවස්ථාදායකය ii අධිකරණය
iii ව්‍යවස්ථාදායකය හා විධායකය iv විධායකය

(08) සෙල්ලිපිවල 'අවරණ' යන යෙදුමින් හැඳින්වූයේ,
i පිටවාන ii ඇතුළුවාන iii සොරොව්ව iv අමුණ

(09) අතීතයේ දී ජජ්ජර නදී හා ගෝණ නදී ලෙස හැඳින්වූ ගංගා දෙක පිළිවෙළින් දක්වා ඇති පිළිතුර වන්නේ,
i දැදුරු ඔය හා කලා ඔය ii කලා ඔය හා දැදුරු ඔය
iii දැදුරු ඔය හා මල්වතු ඔය iv කලා ඔය හා මල්වතු ඔය

(10) වසභ රජුගේ රාජ්‍ය කාලය තුළ යාපනය හැඳින්වීමට භාවිතා කළ නම වූයේ,
i නකදිව ii පොම්පරිප්පු iii පල්ලවංක iv වල්ලිපුරම්

(11) සෙල්ලිපිවල නායක ස්වාමීන් වහන්සේ යටතේ වැඩ වාසය කළ භික්ෂූන් වහන්සේලා හැඳින්වීමට භාවිතා කළ නාමය වන්නේ,
i සද්ධිවිහරිය ii ථෙර iii අන්තේවාසික iv භාණක

(12) අතීත සමාජයේ කාන්තාව පිළිබඳ දක්වා ඇති පහත ප්‍රකාශ වලින් සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

i විවාහ වීම ඇය කළ යුතු සමාජ මෙහෙවරකි  ii රාජ්‍ය පාලන කටයුතු සඳහා ද සුදුසු ය
iii සූප ශාස්ත්‍රයෙහි නිපුණ කරවීම දෙමාපිය වගකීමකි  iv දැඩි සමාජ බලපෑම් වලට යටත්ව වාසය කළාය

(13) පළමුවන විජයබාහු රජතුමා සම්බන්ධයෙන් නිවැරදි පිළිතුර වන්නේ,

i අනුරාධපුරයේ අවසන් පාලකයාය  ii චෝළ පාලනයෙන් රට මුදා ගත්තේය
iii ලම්බකර්ණ වංශයේ ආරම්භකයාය  iv හුරුළු වැව ඉදි කළේය

(14) පහත සඳහන් සිදුවීම් සිදුවූ කාලය අනුව අනුපිළිවෙළින් ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

A - මිහිඳු හිමියන් මෙරටට වැඩම කිරීම
B - සපුමල් කුමාරයා යාපනය මුදා ගැනීම
C - ඉබන් බතූතා නම් අරාබි සංචාරකයා පැමිණීම
D - කාලිංග මාඝ පොළොන්නරුව ආක්‍රමණය කිරීම

i. ACBD  ii BACD  iii ADCB  iv ADBC

(15) මහා වංශයේ සඳහන් පරිදි තමන්ගේ දසවන රාජ වර්ෂයේ දී දිවයිනේ ග්‍රාම සීමා සටහන් කරමින් පරිපාලන ක්‍රමය විධිමත් කළේ,

i පණ්ඩුකාභය රජතුමා  ii දුටුගැමුණු රජතුමා
iii දේවානම්පියතිස්ස රජතුමා  iv වසභ රජතුමා

(16) පහත'අ' තීරුවේ සඳහන් සාහිත්‍ය කෘති 'ආ' තීරුවේ ඇති රාජධානි සමග ගැලපූ විට නිවැරදි පිළිතුර වන්නේ,

| 'අ' | | 'ආ' |
|---|---|---|
| 1 කව් සිළුමිණ | A | - කෝට්ටේ |
| 2 ගුත්තිල කාව්‍ය | B | - කුරුණෑගල |
| 3 දළදා සිරිත | C | – ගම්පොළ |
| 4 සද්ධර්මාලංකාරය | D | - දඹදෙණිය |

i CADB  ii BCAD  iii DBCA  iv DABC

(17) කාර්මික විප්ලවය ප්‍රථමයෙන් ඇතිවූ යුරෝපා රට වන්නේ,

i පෘතුගාලය  ii ප්‍රංශය  iii මහාබ්‍රිතාන්‍යය  iv ස්පාඤ්ඤය

(18) උඩරට ගිවිසුමේ පස්වන වගන්තියෙන් දැක්වෙන්නේ,

i උඩරට ඉංග්‍රීසීන්ට යටත් බව
ii බුද්ධ ශාසනය හා දේවාගම කඩ නොකොට ආරක්ෂා කිරීම පිළිබඳ
iii රජුගේ හතර වරිග නෑයන්ට සිහසුන අහිමි බව
iv උඩරට පාලනය තව දුරටත් රජතුමාට සිදු කළ හැකි බව

(19) පහත 'අ' තීරුවේ සඳහන් සටන් හා 'ආ' තීරුවේ පෘතුගීසි කපිතාන්වරු නිවැරදිව ගැලපූ විට ලැබෙන පිළිතුර කුමක්ද?

| 'අ' | | 'ආ' |
|---|---|---|
| 1 දන්තුරේ සටන | A | - කොන්ස්තන්තීනු ද සා |
| 2 බලන සටන | B | - දියෝගෝද මේලෝ |
| 3 රන්දෙනිවල සටන | C | – ලෝපැස් ද සූසා |
| 4 ගන්නොරුවේ සටන | D | - දොන් ජෙරනිමෝ ද අසවේදූ |

i CBDA  ii DACB  iii BADC  iv CDAB

(20) ක්‍රි.ව. 1800 දී උඩරට රජු හමුවීමට ගිය දූත පිරිසේ නායකයා වන්නේ,

i මැක්ඩෝවල්  ii රොබට් ඇන්ඩෘස්  iii තෝමස් මෙට්ලන්ඩ්  iv රොබට් බ්‍රවුන්රිග්

පහත සඳහන් ප්‍රකාශ කියවා (21), (22) ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - මධ්‍යගත පාලනය බිඳ වැටීම
B - ජනතාව වෙනත් ප්‍රදේශවලට සංක්‍රමණය වීම
C - සතුරු ආක්‍රමණ ඇතිවීම
D - වාණිජ ආර්ථික රටාවකට යොමුවීම
E - නාගරික සැලසුම් ආකෘතියේ වෙනස්කම් ඇතිවීම

(21) පළමු නාගරීකරණයේ නගර පරිහානියට පත්වීමට බලපෑ හේතු ඇතුළත් පිළිතුර වන්නේ,

i A හා C  ii A හා D  iii B හා E  iv A හා C

(22) දෙවන නාගරීකරණය හා සම්බන්ධ තොරතුරු ඇතුළත් පිළිතුර වන්නේ
i A හා B ii C හා A iii D හා E iv A හා E

(23) දේශගවේෂණ කටයුතු සම්බන්ධව පහත ඇති 'අ' හා 'ආ' තීරු ගලපා නිවැරදි පිළිතුර තෝරන්න.

| 'අ' | 'ආ' |
|---|---|
| ප්‍රථමයෙන් ආසියාවට පැමිණීමට මුහුදු මාර්ග සොයා ගැනීම | A. බර්තොලමියු ඩයස් |
| ඇමරිකාව සොයාගැනීම | B. පර්නන්ඩ් මැගලන් |
| අප්‍රිකාවේ දකුණු තුඩුවට පැමිණීම | C. වස්කෝ ද ගාමා |
| ලොව වටා සංචාරය කිරීම | D. ක්‍රිස්ටෝපර් කොලොම්බස් |

i CDAB ii ABDC iii CDAC iv BDAC

(24) කවියෙක්, සංගීතඥයෙක්, ඉංජිනේරුවෙක් ආදී ක්ෂේත්‍ර ගණනාවක ප්‍රවීණයෙක් ලෙස සැලකෙන පුනරුද සමයේ බිහි වූ විද්‍යාඥයා වන්නේ,
i මයිකල් ඇන්ජිලෝ ii ජොහැන්නස් කෙප්ලර්
iii රෆායල් iv ලියනාඩෝ ඩාවින්චි

(25) දෙවන රාජසිංහ රජතුමා ලන්දේසීන් මෙරටට කැඳවා ගැනීමේ අරමුණක් වන්නේ,
i ලන්දේසි ආධාර ලබා පෘතුගීසීන් පලවා හැරීම
ii කුරුඳු වගාව ප්‍රචලිත කිරීම
iii උඩරට පාලන කටයුතු වලට සහාය ලබා ගැනීම
iv උඩරට රදළ ප්‍රධානීන්ගේ වැඩ කටයුතුවලට සහායවීම

(26) උඩරට රාජධානිය ඉංග්‍රීසීන් සතු කර ගැනීම කෙරෙහි බලපෑ ප්‍රධාන හේතුව වන්නේ,
i නායක්කර් වංශිකයන් උඩරට රාජ සභාවේ බලවත් වීම
ii වෙළඳ බෝග සඳහා සුදුසු පරිසරයක් තිබීම
iii ආරක්ෂක වියදම් වැඩිවීම හා පාලනයට බාධා ඇතිවීම
iv ත්‍රිකුණාමල වරායේ වැදගත්කම

ඉංග්‍රීසි පාලනය හා සම්බන්ධ කරුණු කිහිපයක් පහත දැක්වේ. ඒවා අධ්‍යයනය කොට (27), (28) ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
A - බදු එකතු කිරීමට දේශීය නිලධාරීන් පත් කිරීම
B - ආදායම් එකතු කිරීමට හා අධිකරණ කටයුතු සඳහා වෙන වෙනම නිලධාරීන් පත් කිරීම
C - මුහුදු බඩ ප්‍රදේශ පාලනයට රෙසිඩන්ටවරයෙකු පත් කිරීම
D - නව බදු වර්ග කිහිපයක් පැනවීම
E - ලන්දේසි උසාවි ක්‍රමය යළි පිහිටුවීම

(27) 1797 ඉංග්‍රීසි වෙළඳ සමාගමට එරෙහිව කැරැල්ල ඇතිවීමට හේතු ඇතුළත් පිළිතුර වන්නේ,
i B හා E ii A හා C iii C හා D iv A හා D

(28) කැරැල්ල සම්බන්ධව සොයා බැලීමට පත් කළ මියුරන් කොමිසම ගෙන ආ නිර්දේශ ඇතුළත් පිළිතුර වන්නේ,
i B හා C ii B හා E iii D හා E iv A හා D

(29) කාර්මික විප්ලවයේ ප්‍රතිඵලයක් ලෙස ''මැකඩම් ක්‍රමය'' හඳුන්වාදෙනු ලැබූයේ,
i යපස් උණු කිරීමේ ක්‍රමයක් ලෙසයි ii පේෂ කර්මාන්තයේ දී කපු නූල් සැකසීම සඳහා ය
iii මහාමාර්ග ඉදිකිරීම සඳහා ය iv පණිවුඩ හුවමාරු ක්‍රමයක් ලෙසය

(30) ඉංග්‍රීසීන් මෙරටට පැමිණෙන විට ලංකාවේ සිටි ලන්දේසි ආණ්ඩුකාරයා වන්නේ,
i විලියම් ෆල්ක් ii ෆන් එංගල් බෙක් iii වෙස්ටර්වෝල්ඩ් iv ස්පිල්බර්ජන්

(31) කාර්මික විප්ලවය හා සම්බන්ධ තොරතුරු කිහිපයක් 'අ' හා 'ආ' තීරුවල දැක්වේ. සුදුසු පරිදි ගලපා නිවැරදි පිළිතුර තෝරන්න.

| | 'අ' | | | 'ආ' |
|---|---|---|---|---|
| 1 | හම්ප්‍රි ඩේවි | A | - | මියුල් යන්ත්‍රය |
| 2 | ජෝර්ජ් ස්ටීවන්සන් | B | - | රෝලර් යන්ත්‍රය |
| 3 | සැමුවෙල් ක්‍රොම්ප්ටන් | C | – | ආරක්ෂක ලාම්පුව |
| 4 | හෙන්රි කෝට් | D | - | දුම්රිය එන්ජිම |

i CDBA ii CBAC iii DBAC iv BACD

(32) 1848 දෙවන නිදහස් අරගලයට ආසන්නතම හේතුව වූයේ,
- i ඉංග්‍රීසීන් විසින් වතු වගාව ආරම්භ කිරීම
- ii ටොරින්ටන් ආණ්ඩුකාරයා නව බදු වර්ග රැසක් පැනවීම
- iii ගම්සභා ක්‍රමය අඩපණ වීම
- iv කැමරන් යෝජනා අනුව නව අධිකරණ ප්‍රතිසංස්කරණ ගෙන ඒම

(33) 1818 - 1848 නිදහස් අරගලවල ප්‍රධාන මධ්‍යස්ථාන දෙක පිළිවෙලින් දැක්වෙන්නේ කිනම් පිළිතුරේ ද?
- i ඌව වෙල්ලස්ස හා ගන්නොරුව ii මහනුවර හා බලන
- iii ඌව වෙල්ලස්ස හා මාතලේ iv මාතලේ හා ඌව වෙල්ලස්ස

(34) ශ්‍රී ලංකාවේ බ්‍රිතාන්‍ය බලය පිහිටුවා ගැනීම සම්බන්ධයෙන් පහත ප්‍රකාශ අතුරින් සාවද්‍ය ප්‍රකාශය කුමක්ද?
- i 1800 වර්ෂයේ දී මැක්ඩෝවල්ගේ නායකත්වයෙන් උඩරටට දූත පිරිසක් යැවීය
- ii මෙහි පැමිණි ප්‍රථම ඉංග්‍රීසි ආණ්ඩුකාරයා පෙඩ්රික් නෝත්ය
- iii උඩරට දෙවන නිදහස් අරගලයෙන් පසුව ටොරින්ටන් ආණ්ඩුකාරයා එංගලන්තයට කැඳවීය
- iv උඩරට ගිවිසුම අත්සන් කරන අවස්ථාවේ පූජ්‍ය හික්කඩුවේ සුමංගල හිමි ඉංග්‍රීසි කොඩිය බිම හෙළා සිංහ කොඩිය එසවීය

(35) ඉංග්‍රීසි පාලනය නිසා ශ්‍රී ලාංකිකයින්ට උරුම වූ දායාදයක් නොවන්නේ,
- i පැරිස් පාසල් ආරම්භ කිරීම ii ඉංග්‍රීසි දැනුම රට තුළ ප්‍රචලිත වීම
- iii අපනයන වැවිලි භෝග හඳුන්වාදීම iv යටිතල පහසුකම් සංවර්ධනය වීම

(36) පොළොන්නරුව රාජධානිය බිඳ වැටීමෙන් පසු දන්තධාතුන් වහන්සේගේ ආරක්ෂාව සඳහා සඟවා තැබුවේ කිනම් ස්ථානයේද?

i හඟුරන්කෙත ii බෙලිගල iii කොත්මලේ iv රත්නපුරය

- පහත සඳහන් ABCD යන යුගල අධ්‍යයනය කර 37 - 40 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A - (1) ත්‍රිකුණාමල වරාය බෙංගාල බොක්කට මුහුණලා පිහිටීම
(2) නාවික වෙළඳ කටයුතු

B - (1) උඩරට ආක්‍රමණය
(2) ජෝන් ඩොයිලිගේ බුද්ධිමත් ක්‍රියා කලාපය

C - (1) වතු බෝග වගාව
(2) යැපුම් කෘෂි කර්මාන්තය

D - (1) 1833 කෝල්බෲක් ප්‍රතිසංස්කරණ
(2) කඩුගන්නාව හරහා මහාමාර්ගය ඉදි කිරීම

(37) පළමුවැන්න නිසා දෙවැන්න වර්ධනයට හේතු වන යුගලය,

i A ii B iii C iv D

(38) පළමුවැන්නේ වර්ධනය නිසා දෙවැන්න ක්‍රමයෙන් පිරිහීමට ලක් වූ බව කියැවෙන ප්‍රකාශය,

i A ii B iii C iv D

(39) දෙවැන්න නිසා පළමුවැන්න පහසු වූ බව හැඟවෙන ප්‍රකාශය කුමක්ද?

i A ii B iii C iv D

(40) ප්‍රකාශ දෙක අතර කිසිදු සම්බන්ධතාවයක් නොපෙන්වන ප්‍රකාශ යුගලය,

i A ii B iii C iv D

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## පළමු වාර පරීක්ෂණය - 2020

## 11 - ශ්‍රේණිය

## ඉතිහාසය - II

නම/විභාග අංකය :- ......................................................... කාලය: පැය 03 යි.

සැලකිය යුතුයි:
- I කොටසේ පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- II කොටසින් ප්‍රශ්න හතරකට ද, III කොටසින් එක් ප්‍රශ්නයකට ද පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව හයකි.

### 1 කොටස

(01) (අ) පහත (i) යටතේ ඇති ඓතිහාසික ස්ථාන සියල්ලම සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද, (ii) යටතේ දක්වා ඇති ස්ථාන සියල්ලම සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.

(i) හුරුළු වැව, කැළණි ගඟ, දේව නගර, සීගිරිය, මහනුවර, මැණික් ගඟ, පුලතිසිපුර, මහාතිත්ථ, ශ්‍රී ජයවර්ධනපුරය, ගාල්ල, පාහියන්ගල, කල්පිටිය (ලකුණු 12)

(ii) රතු මුහුද, බතාවිය, ඉතාලිය, චීනය, කොන්ස්තන්තිනෝපල්, මලක්කා සමුද්‍ර සන්ධිය (ලකුණු 06)

(ආ) පහත ABC හා D යටතේ ඇති ඓතිහාසික සිදුවීම් හා සම්බන්ධ පුද්ගලයන්ගේ නම් අනුපිළිවෙළින් දක්වන්න.

(i) A - මෙරට විශාල ප්‍රමාණයේ වැව් ඉදි කිරීමේ ආරම්භක පාලකයා කවුද ?
B - කලිකාල සාහිත්‍ය සර්වඥපණ්ඩිත යන විරුදනාමයෙන් පිදුම් ලැබූ පාලකයා කවුද?
C - ලංකාවට පැමිණි පළමු පෘතුගීසි ජාතිකයා කවුද?
D - ප්‍රවාහන ක්ෂේත්‍රයේ විප්ලවයක් සිදු කළ දුම්රිය ඇන්ජිම සොයා ගත් පුද්ගලයා කවුද? (ලකුණු 04)


(ii) පහත A හා B යටතේ ඇති පින්තූර අධ්‍යයනය කොට අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක අනුපිළිවෙළින් ලියා දක්වන්න.

(A)



1. මෙම නිර්මාණය හඳුන්වන නම කුමක්ද?
2. මෙය පිහිටුවා ඇති ස්ථානය කුමක්ද?
3. එය කරවූ රජතුමා කවුද?
4. පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය වර්ගීකරණය අතරින් මෙය අයත් වන්නේ කුමන වර්ගයට ද? (ලකුණු 04)

(B)



(iii) 1. මෙය හඳුන්වන නම කුමක්ද?
2. මෙය නිපද වූ තැනැත්තා කවුද?
3. මෙය සොයා ගැනීමේ ප්‍රතිඵලය කුමක්ද?
4. මෙය සොයා ගැනීම කාර්මික විප්ලවයේ කුමන කර්මාන්ත ක්ෂේත්‍රයක් හා සම්බන්ධ වේ ද?

(ලකුණු 04)

## 11 කොටස

(02) (i) පහත සඳහන් මූලාශ්‍ර වර්ගවලට උදාහරණ එක බැගින් ලියා දක්වන්න.

1. සංදේශ කාව්‍ය
2. ප්‍රශස්ති කාව්‍ය
3. හටන් කාව්‍ය (ලකුණු 03)

(ii) ඉතිහාසය ගොඩ නැගීම සඳහා සාහිත්‍ය මූලාශ්‍ර යොදා ගැනීමේ දී ද කරුණු කිහිපයක් කෙරෙහි සැලකිල්ල යොමු කළ යුතුයි. ඉන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) ඉතිහාසය ගොඩ නැගීමේ දී සාහිත්‍ය මූලාශ්‍රවල ප්‍රයෝජන දෙකක් සඳහන් කර කෙටියෙන් පැහැදිළි කරන්න. (ලකුණු 03)

(iv) ඉතිහාසය ඉගෙනීමේ වැදගත්කම පිළිබඳව කරුණු තුනක් සඳහන් කර කෙටියෙන් පැහැදිළි කරන්න. (ලකුණු 06)

(03) (i) ප්‍රාග් ඓතිහාසික මානවයා ජනාවාස පිහිටුවා ගත් පරිසර කලාප තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) ප්‍රාග් ඓතිහාසික මානවයාගේ ආහාර රටාව අනුව දඩයම් කළ සතුන් හා ශාඛ ආහාර වර්ග දෙක බැගින් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) පූර්ව ඓතිහාසික යුගයේ අභිචාර විධි දෙකක් නිදසුන් සහිතව පැහැදිළි කරන්න. (ලකුණු 05)

(iv) a - මුල් ඓතිහාසික යුගයේ ජනාවාස ව්‍යාප්තියට බලපෑ සාධක දෙකක් හා (ලකුණු 02)

b - ගමික විසින් ඉටු කළ කාර්යයන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 03)

(04) (i) පහත සඳහන් වැව් ඉදි කළ රජතුමා ABC අනුපිළිවෙළින් සඳහන් කරන්න.

A - තිසා වැව

B - මින්නේරිය වැව

C - කලා වැව (ලකුණු 03)

(ii) පහත සඳහන් කාර්යයන් සඳහා අය කළ බදු වර්ග අනුපිළිවෙළින් ලියා දක්වන්න.

A – වැව් ජලය භාවිතා කිරීම

B - හේන් වගා කිරීම

C - රජුට අයත් ඉඩම්වල වගා කිරීම

D - ඇළ මාර්ග වලින් මසුන් ඇල්ලීම (ලකුණු 04)

(iii) ශ්‍රී ලංකාවේ පැරණි සමාජයේ දේශීය හා විදේශීය වෙළඳාම තිබූ බව කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) අන්‍ය සංස්කෘතීන්ට අයත් ජන කණ්ඩායම් සමග සුහදශීලීව ජීවත්වීම ඉතිහාසයේ කැපී පෙනෙන ලක්ෂණයක් විය. නිදසුන් තුනක් සඳහන් කර පැහැදිළි කරන්න. (ලකුණු 06)

(05) (i) පහත ප්‍රකාශ කියවා ABC අනුපිළිවෙළින් සඳහන් කරන්න.

A - පළමු නාගරීකරණයට අයත් ප්‍රථම සැලසුම්ගත අගනුවර

B - දෙවන නාගකරීණයට අයත් ප්‍රථම අගනුවර

C - දෙවන නාගකරීණයට අයත් අවසාන අගනගරය (ලකුණු 03)

(ii) නායක්කර් වංශයට අයත් රජවරු සිව් දෙනා අනුපිළිවෙලින් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) a – උඩරට රජතුමා විසින්ම විසඳූ නඩු වර්ග දෙකක් හා

b – එකල වැරදිකරුවන්ට ලබා දුන් දඬුවම් වර්ග තුනක් සඳහන් කරන්න. (ලකුණු 05)

(iv) මහනුවර රාජධානි සමයේ පැවති කෘෂිකාර්මික ආර්ථික ක්‍රමය පිළිබඳ කරුණු තුනක් පැහැදිළි කරන්න. (ලකුණු 06)

(06) (i) පහත ABC වලින් දැක්වෙන ස්ථාන පෙරදිග වෙළඳ මධ්‍යස්ථාන වශයෙන් යොදාගත් යුරෝපා ජාතීන් අනුපිළිවෙළින් සඳහන් කරන්න.

A - ගෝව

B - බතාවිය

C - මදුරාසිය (ලකුණු 03)

(ii) උඩරට බලය අල්ලා ගැනීමට පෘතුගීසීන් අවස්ථා කිහිපයක් උත්සාහ ගත්හ. පහත වර්ෂවල සිදුවූ සටන් ABC හා D අනුපිළිවෙළින් වරහන් තුළින් ලියන්න.

A – 1594

B – 1602

C - 1630

D - 1638

(බලන / දන්තුරේ /මුල්ලේරියා/ රන්දෙනිවල/ ගන්නොරුව) (ලකුණු 04)

(iii) a – 1638 උඩරට ගිවිසුමට අත්සන් තැබූ උඩරට රජතුමා හා ලන්දේසි ජාතිකයා කවුද?

b – 1638 ගිවිසුමේ මූලික කරුණු 3 ක් සඳහන් කරන්න. (ලකුණු 05)

(iv) පෘතුගීසි හෝ ලන්දේසි ජාතිකයන්ට උඩරට අල්ලා ගැනිමට නොහැකි වීමට හේතු වූ කරුණු තුනක් පැහැදිළි කරන්න. (ලකුණු 06)

(07) (i) ඉංග්‍රීසීන් මෙරට මුහුදුබඩ අත්පත්කර ගැනීමට පෙර ඔවුන්ගේ දූතයන් කීපදෙනෙක් වරින්වර උඩරටට පැමිණ තිබේ. එම දූතයන් තිදෙනා නම් කරන්න. (ලකුණු 03)

(ii) ඉංග්‍රීසින් මෙරට තම බලය පිහිටුවා ගත් ප්‍රධාන අවස්ථා දෙක සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) a – ඉංග්‍රීසීන්ගේ අවධානය ශ්‍රී ලංකාව කෙරෙහි යොමුවීමට බලපෑ ප්‍රධාන හේතු දෙකක් හා

b – ත්‍රිකුණාමල වරාය කෙරෙහි ඉංග්‍රීසීන්ගේ සැලකිල්ල යොමුවීමට බලපෑ කරුණු 3 ක් සඳහන් කරන්න. (ලකුණු 05)

(iv) a – 1818 උඩරට නිදහස් අරගලයේ නායකයන් දෙදෙනෙක් හා

b – එම නිදහස් අරගලය අසාර්ථකවීමට හේතු තුනක් සඳහන් කරන්න. (ලකුණු 06)

## 111 කොටස

(08) (i) පුනරුද සමයේ පහත සොයා ගැනීම් සිදු කළ පුද්ගලයන් කවුද?

A - මුද්‍රණ යන්ත්‍රය

B - රුධිර සංස්සරණ පද්ධතිය

C - ගුරුත්වාකර්ෂණ නියමය (ලකුණු 03)

(ii) පුනරුදය ඇතිවීමට බලපෑ හේතු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) a – නව වෙළඳ මාර්ග සෙවීමට මුල්වූ රටවල් දෙක හා

b – එම නිදහස් යුරෝපා ජාතීන් මෙරටට පැමිණීම නිසා ඇති වූ ආර්ථික වෙනස්කම් තුනක් සඳහන් කරන්න. (ලකුණු 05)

(iv) ''පුනරුද සමයේ නව මුහුදු මාර්ග සොයා ගැනීමේ ගමන සාර්ථක වීමට නව සොයා ගැනීම් උපකාරී විය'' උදාහරණ තුනක් ඇසුරින් මේ බව සනාථ කරන්න. (ලකුණු 06)


(09) (i) බ්‍රිතාන්‍ය හැරුණු විට කාර්මික විප්ලවය ව්‍යාප්ත වූ රටවල් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) බ්‍රිතාන්‍යයේම කාර්මික විප්ලවය ආරම්භ වීමට හේතු වූ කරුණු දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)


(iii) කාර්මික විප්ලවය නිසා සන්නිවේදන ක්ෂේත්‍රයේ ඇති වූ දියුණුව කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

(iv) කාර්මික විප්ලවය නිසා කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සිදු වූ වෙනස්කම් කරුණු දෙකක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 06)

(01) (අ) (i)



(01) (අ) (ii)



**11 ශ්‍රේණිය පළමු වාරය ඉතිහාසය 1 පිළිතුරු පත්‍රය**

| | | | |
|---|---|---|---|
| 01 - 3 | 11 - 3 | 21 - 3 | 31 - 1 |
| 02 - 4 | 12 - 4 | 22 - 2 | 32 - 2 |
| 03 - 2 | 13 - 2 | 23 - 1 | 33 - 3 |
| 04 - 1 | 14 - 3 | 24 - 4 | 34 - 4 |
| 05 - 2 | 15 - 1 | 25 - 1 | 35 - 1 |
| 06 - 2 | 16 - 4 | 26 - 3 | 36 - 1 |
| 07 - 3 | 17 - 3 | 27 - 4 | 37 - 3 |
| 08 - 4 | 18 - 2 | 28 - 2 | 38 - 1 |
| 09 - 1 | 19 - 4 | 29 - 3 | 39 - 4 |
| 10 - 1 | 20 - 1 | 30 - 2 | 40 - 3 |

**11 පත්‍රය 1 කොටස**

(01)(ආ) (i) A - වසභ රජතුමා
B – 11 පරාක්‍රමබාහු රජතුමා
C - ලොරෙන්සෝ ද අල්මේදා
D- ජෝර්ජ් ස්ටීවන්සන්

(ii) 1 ගල්පොත සෙල්ලිපිය/ ශිලා ලිපිය
2 පොළොන්නරුව /පුලතිසිපුර
3 කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල / නිශ්ශංකමල්ල රජු
4 අභිලේඛන

(iii) 1 වානේ නිපදවීමේ උදුන
2 හෙන්රි බෙසමර්
3 යකඩවල අපද්‍රව්‍ය ඉවත් කිරීම/වානේ නිපදවීම
4 යකඩ හා වානේ කර්මාන්තය

(2) (i) 1 සැළලිහිණි, ගිරා, මයූර, හංස, තිසර
2 පැරකුම්බා සිරිත
3 සීතාවක හටන, කොන්ස්තන්තීනු සටන, ඉංග්‍රීසි හටන

(ii) ⋆ මූලාශ්‍රයේ කතුවරයා ⋆ රචනා වූ කාලය
⋆ කතුවරයාගේ අරමුණ ⋆ මූලාශ්‍රයට කරුණු සපයා ගත් ආකාරය

(iii) ⋆ ඓතිහාසික කාල අනුපිළිවෙළ සකසා ගැනීම සඳහා
⋆ එක් එක් අවධිවල දේශපාලන ආර්ථික සමාජ හා සංස්කෘතික තොරතුරු ලබා ගැනීම සඳහා
⋆ එක් මූලාශ්‍රයක් මගින් ලබා ගන්නා තොරතුරු මගින් තවත් මූලාශ්‍රයක් මගින් සනාථ කර ගැනිමට
⋆ දේශීය සාහිත්‍ය මූලාශ්‍ර මගින් රටක විදේශ සම්බන්ධතා අධ්‍යයනය කිරීමට

(iv) රටේ ජාතික අනන්‍යතාව හඳුනා ගැනීමට /තමා ජීවත්වන සමාජය හා ලෝකය පිළිබඳ යථාවබෝධය ලබා ගැනීමට/අතීත අත්දැකීම් මගින් වර්තමානය තේරුම් ගෙන අනාගතය ගොඩ නැගීමට /අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීමට/විවිධ මත ඉවසීමට හුරුවීම

(03)(i) අර්ධ ශුෂ්ක කලාපය /පහතරට වියළි කලාපය/තෙත් කලාපය/පහතරට අතරමැදි වියළි කලාපය/ කඳුකර වියළි අතරමැදි කලාපය /ශුෂ්ක කලාපය

(ii) සතුන් - ගවරා, කුළු මී හරකා, වල් ඌරා, ගෝනා, මුවා, මීමින්නා, ඉත්තෑවා වැනි සතුන් දෙදෙනෙක්
ශාඛ - කැලෑ දෙල්, කැලෑ කෙසෙල්, ගෝනල, කටුතල, කිතුල් ඇට මද, දෝතලු ඇට මද මේවායින් දෙකක්

(iii) ⋆ මහා ශිලා සුසාන භාවිතය, කුම්භීය නිඛනන භාවිතය
⋆ මැටි ඔරු සුසාන ක්‍රමය යොදා ගැනීම

(iv) a ප්‍රධාන සාධකය භූ භෞතික පසුබිම (ලකුණු 02)

වාර්ෂික වර්ෂාපතන අගය/පසේ ස්වභාවය /භූ විෂමතාවය /ජලවහනය/ස්වභාවික සම්පත්වල ව්‍යාප්තිය

b ගම්වල පොදු කටයුතුවලට නායකත්වය දීම/ ගමට අයත් වැව නඩත්තු කිරීම /වැව් ජලය බෙදාදීම/ගම්වල ආරවුල් විසඳීම/ගම් නායකයන් සමග සුහදව කටයුතු කිරීම /ගමේ සාමය පවත්වාගෙනයාම (ලකුණු 2+3)

(04)(i) A - දේවානම්පියතිස්ස රජු
B - මහසෙන් රජු
C - ධාතුසේන රජු (ලකුණු 03)

(ii) A – දකපති C - බොජකපති
B - කැති අඩ/ කෙටු කනබ D- මතරමජිබක

(iii) නගර ආශ්‍රිතව වෙළඳාම දියුණුව පැවතීම/ රට වටා වෙළඳ වරායන් පැවතීම / වෙළඳ ගම් තිබීම/වෙළඳාම සම්බන්ධ රජු නීති පැනවීම/උදා iv උදය රජුගේ සොරබොරවැව ටැම් ලිපිය /දේශීය විදේශීය වෙළඳපල තිබීම/ විදේශීය වෙළඳ සංවිධාන තිබීම/ වෙළඳාමේ නියුතු පිරිස් වාණිජ, වාපර නමින් හැඳින්වීම

(iv) නාගරික ජන කණ්ඩායම් තුළ විවිධ සංස්කෘතීන්ට අයත් අය වාසය කිරීම ((දෙමළ ජනයාගේ ශුභසාධන කටයුතු සෙවීමට රාජ සහාය''දෙමළ අධිකාරී'' විශේෂ තනතුරක් තිබීම/දෙමළ ජාතික භික්ෂූන් සිටි බවට සාධක තිබීම /දෙමළ ජාතිකයන් හමුදා සේවයේ යෙදී සිටීම/ 1 විජයබාහු රජුගේ හමුදාවේ කේරළ දේශයෙන් පැමිණි අගම්පඩි සේනාව සිටීම/දළදා මාලිගාවේ ආරක්ෂාවට වේලෙක්කාර (කේරළ දේශයෙන් පැමිණි හමුදාවට බාරදීම වැනි කරුණු 3 ට ලකුණු 3 යි පැහැදිළි කිරීමට ලකුණු 3යි

(05)(i) A - අනුරාධපුරය
B - දඹදෙණිය
C - කෝට්ටේ

(ii) 1 ශ්‍රී විජය රාජසිංහ 2 කීර්ති ශ්‍රී රාජසිංහ 3 රාජාධිරාජසිංහ 4 ශ්‍රී වික්‍රම රාජසිංහ

(iii) a – කුමන්ත්‍රණ නඩු /රාජද්‍රෝහිත්වය සම්බන්ධ නඩු/ වැදගත් නායකයන් සම්බන්ධ නඩු/කැරලි කෝලාහල නඩු /විහාර හා භික්ෂූන් සම්බන්ධ නඩු

b- අතුල් පහර ගැසීම/දඬ ගැසීම/කස පහරදීම/දඬුකඳේ ගැසීම/පිටුවහල් කිරීම/දියේ ගිල්වා මැරීම/ඇතුන් ලවා පෑගීම වැනි

(iv) පාරිභෝජනය පදනම් කරගත් ආර්ථිකයක් වීම /ස්වයංපෝෂිත ආර්ථික රටාවක් පැවතීම /හෙල්මළු ක්‍රමයට වී වගා කිරීම/වැඩි ඉඩම් ප්‍රමාණයක හේන් වගාව/හේන්වල කුරක්කන්, අමු, මෙනේරි, ඉරිඟු, අල, බතල වගා කිරීම /ගෙවතු වගාව තුළ කොස්, දෙල්, ගම්මිරිස්, සාදික්කා, එළවළු, පළතුරු වගා කිරීම /යකඩ, දැව, ලෝහ, ලාක්ෂා කර්මාන්ත දියුණුව පැවතීම /කිරි ලබා ගැනීමට සත්ත්ව පාලන කටයුතු සිදු කිරීම

(06)(i) A - පෘතුගීසි B - ලන්දේසි C- ඉංග්‍රීසි

(ii) A – දන්තුරේ B – බලන C - රන්දෙනිවල D- ගන්නොරුව

(iii) a – 11 රාජසිංහ රජු/වෙස්ටර්වෝල්ඩ්

b – - පෘතුගීසීන් මෙරටින් පලවා හැරීමට උඩරට රජුට සහායවීම

ලන්දේසීන්ට ඒ සඳහා වැය වන මුදල් වෙළඳ ද්‍රව්‍ය මගින් ගෙවීමට රජු එකඟ වීම (මී ඉටි, කුරුඳු, ගම්මිරිස්)

ඇතුන් හැර උඩරට සෙසු වෙලඳ ද්‍රව්‍ය ලබා ගැනීමේ ඒකාධිකාරී අයිතිය ලන්දේසීන්ට ලැබීම

පෘතුගීසීන්ගෙන් අල්ලා ගන්නා ලද බලකොටුවල රජු අදහස් කරන්නේ නම් ලන්දේසි හමුදාව නතර කරවීමට එකඟවීම

(iv) ⋆ උඩරට සාමාන්‍ය ජනතාව රදළ ප්‍රධානීන් භික්ෂූන් වහන්සේලා ඇතුළු සියලු දෙනාගේ සහයෝගය ලැබීම

⋆ උඩරට රාජධානියේ ස්වභාවික ආරක්ෂාව ගිරදූර්ග, වන දූර්ග, ජල දූර්ග

⋆ සිංහලයන්ගේ ගරිල්ලා සටන් ක්‍රමය

⋆ ලස්කිරිඤ්ඤ හමුදාව සිංහලයන්ගේ පැත්ත ගැනීම

(07)(i) ජෝන් පයිබස්
හියු බොයිඩ් රොබට් ඇන්ඩෘස්

(ii) 1796 මුහුදුබඩ ප්‍රදේශ අල්ලා ගැනීම
1815 උඩරට අල්ලා ගැනීම

(iii) a – ශ්‍රී ලංකාවේ පිහිටීම, ශ්‍රී ලංකාවෙන් කුරුඳු ඇතුළු වටිනා වෙළඳ ද්‍රව්‍ය ලබා ගැනිමට හැකිවීම

b – ⋆ ත්‍රිකුණාමල වරාය බෙංගාල බොක්කට මුහුණ ලා පිහිටා තිබීම

⋆ ඉන්දියාවේ නැගෙනහිර වෙරළේ ඉංග්‍රීසි නාවික බලය රැක ගැනීමට

⋆ මෝසම් සුළං කාලවලදී නැව් ආරක්ෂා කර ගැනීමට ත්‍රිකුණාමල වරාය යොදා ගත හැකිවීම

(iv) a – මොනරවිල කැප්පෙටිපොල, මඩුගල්ලේ ,කිවුලේගෙදර මොහොට්ටාල, බූටෑවේ රටේ රාළ

b – ⋆ ඉංග්‍රීසින්ගේ දැඩි මර්ධනකාරී ප්‍රතිපත්තිය මාෂල් ලෝ හා බිම්පාළු ප්‍රතිපත්තිය

⋆ සංවිධානාත්මක නොවීම

⋆ රදළයන් අතර පෞද්ගලික ඊර්ෂ්‍යාවාදිකම්

⋆ ප්‍රමාණවත් අවිආයුධ නැතිවීම

⋆ රජු ලෙස පෙනී සිටි තැනැත්තා ව්‍යාජ අයකුවීම

(08)(i) A - ජොහැන්නස් ගුටෙන් බර්ග්

B - විලියම් හාවේ

C - අයිසෙක් නිව්ටන්

(ii) ⋆ 1463 කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කින් අතට පත්වීම

⋆ වෙළඳාම දියුණුවීම හා නව ධනවතුන් පිරිසක් බිහිවීම

⋆ යුරෝපයේ ඇතිවූ පුනරුදය

⋆ පල්ලියේ ආධිපත්‍ය බිඳ වැටීම

(iii) a – පෘතුගාලය, ස්පාඤ්ඤය

b – ★ වෙළඳ බෝග වගාව ව්‍යාප්ත කිරීම
★ වාණිජ ආර්ථික රටාවකට හුරුවීම
★ ස්වයංපෝෂිත කෘෂි ආර්ථික රටාව පිරිහීයාම
★ මුදල් භාවිතය ප්‍රචලිතවීම
★ දුම්රිය මාර්ග මහාමාර්ග පද්ධතියක් වීම
★ කොළඹ, ගාල්ල, ත්‍රිකුණාමලය වැනි වෙළඳ නගර බිහිවීම


(iv) ★ නාවික ගමන්වල ආරක්ෂා සහිතව යෙදීමට හැකි මාලිමා යන්ත්‍රය උතුරු තරු මාපකය නිපදවීම
★ පුනරුදයේ දී ලෝකය ගෝලාකාර බව සොයා ගැනීම
★ ටොලමි අඳින ලද ලෝක සිතියම මගින් ලෝකය ගැන අවබෝධන ලබා ගැනීම
★ ජාතික රාජ්‍ය අනුග්‍රහය දැක්වීම

(09)(i) ප්‍රංශය, පෘතුගාලය, ස්පාඤ්ඤය, ඕලන්දය


(ii) කර්මාන්ත සඳහා මුදල් ආයෝජනය කළ හැකි ධනවතුන් පිරිසක් එරට බිහිවීම/දේශපාලන ස්ථාවරත්වය/අවශ්‍ය අමුද්‍රව්‍ය බහුලවීම/ජනගහනය අධිකවීම හා ඒ නිසා ඉල්ලුම වැඩිවීම /අතිරික්ත ශ්‍රම හමුදාවක් සිටීම /වෙළඳපොල දියුණුවීම

(iii) 1840 පෙනී තැපැල් සේවය ආරම්භ කිරීම /1844 මෝස් විදුලි පණිවුඩ ක්‍රමය සොයා ගැනීම/විදුලි පණිවිඩ ක්‍රමය සොයා ගැනීම/ගුවන්විදුලි යන්ත්‍රය සොයා ගැනීම/රූපවාහිනිය සොයා ගැනීම

(iv) මහා පරිමාණ ගොවිබිම් ආරම්භ කිරීම/ශෂ්‍ය මාරු ක්‍රමය/සත්ත්ව පාලන කටයුතු සඳහා නව තාක්ෂණය භාවිතය/නව කෘෂිකර්ම උපකරණ සොයා ගැනීම හා නව වගා ක්‍රම සොයා ගැනීම


උ
මහාතිත්ථ
හුරුළු වැව
කල්පිටිය
සීගිරිය
පුලතිස්පුර
මහනුවර
කැළණි ගඟ
ශ්‍රී ජයවර්ධනපුරය
පාහියන්ගල
මැණික් ගඟ
ගාල්ල
දේවනගර

(1) (අ) (ii)




අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර පත්‍රිකා සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට
www.lol.lk
Learn Ordinary Level
LOL.lk
online Book Store
අමතන්න - 071 777 4440/0756999990/071 8540371
G.C.E. O/L PAST PAPERS
අ.පො.ස. සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර
2010 සිට 2019 දක්වා
A+ GUIDE PAST PAPERS
ගණිතය
MATHEMATICS
විද්‍යාව
SCIENCE
ඉතිහාසය
HISTORY
සිංහල භාෂාව හා සාහිත්‍යය
SINHALA LANGUAGE AND LITERATURE
සංගීතය (පෙරදිග)
MUSIC (ORIENTAL)
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
INFORMATION & COMMUNICATION TECHNOLOGY
සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය
HEALTH AND PHYSICAL EDUCATION
භූගෝල විද්‍යාව
GEOGRAPHY
ඉංග්‍රීසි භාෂාව
ENGLISH LANGUAGE
නාට්‍ය හා රංග කලාව
DRAMA AND THEATRE
නැටුම් (දේශීය)
DANCING (ORIENTAL)
කතෝලික ධර්මය
CATHOLICISM
ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය
BUSINESS & ACCOUNTING STUDIES
බුද්ධ ධර්මය
BUDDHISM
චිත්‍ර
ART
Ex/Press/2019/0034
Online shopping
www.lol.lk
Learn Ordinary Level
DELIVERY ISLANDWIDE
SECURE PAYMENT

LOL.lk
online Book Store
071 777 4440/0756999990/071 8540371


## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්




## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්




## කෙටි සටහන් පොත්




වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

PAST PAPERS WIKI

ප්‍රශ්නපත්‍ර පොත්
ගෙදරටම ගෙන්ව ගන්න
ඔන්ලයින් ඕඩර් කරන්න
WWW.LOL.LK
වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal
NO PAYPAL ACCOUNT NEEDED!

ONLINE
BOOK STORE

An evening of fun for young readers

